(එ) මිල සහ වැටුප්

1. මිල

කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙන්[1] පිළිබිඹු වන පරිදි, 1972 පාරිභෝගික මිලෙහි වැඩිවීම සියයට 6·3 ක් වී ඇත. 1971 දී මෙම වැඩිවීම සියයට 2·7 ක් වී ඇත. ඉකුත් පස් වසර තුළ මෙම මිල දර්ශකයෙහි වැඩිවීම සාමාන්‍යය දළ වශයෙන් සියයට 5·6 කි.

1971 අවසාන කාර්තුවේදී පටන් ගැනුන මිල ඉහළ යෑම 1972 දී මුළු වසර තුළම ක්‍රියාත්මකව පවතින්නට විය. මෙම මිල ඉහළ යෑමට කරුණු කිහිපයක්ම හේතු විණි. ඇතැම් අවස්ථාවන්හි, ආනයනය කළ භාණ්ඩයන්ගේ මිල ඉහළ යෑමට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ ව්‍යවහාර මුදල් අනුපාතිකයන් නැවත සකස් කිරීමත්, අධික නැව් ගාස්තු නිසා දේශීය මිල ඉහළ යෑමත්ය. විෂම කාලගුණ තත්ත්වයන් නිසා, දේශීය වශයෙන් නිෂ්පාදනය කළ කෘෂිකාර්මික භාණ්ඩයන්ගේ සැපයුමෙහි ඇතිවූ හිඟයයන් මිල කෙරෙහි තවත් බලපෑමක් ඇති කරවීය. නිෂ්පාදනය වැඩිකිරීම සඳහාත්, තහනම් කළ හෝ සීමා කළ සමහර ආනයනයන් නිසා සැපයුමෙහි ඇතිවූ හිඟයයන් එමගින් සමහන් කිරීමටත් මිල මගින් දිරිගැන්වීම් සලසනුවස්, භාණ්ඩ රාශියක්ම මිල පාලනයෙන් ඉවත් කරනලදී පාලනයෙන් ඉවත් කැරුණ ප්‍රධාන ශීර්ෂයන් වූයේ, රතුළුනු, මීරිස්, ගිණිපෙට්ටි, දන්තාලේප, කමිස, කෘතිම රෙදිපිළි, ට්‍රාන්සිස්ටර් හා විදුලිපන්දම් බැටරි සහ ඖෂධ වර්ග 10 කි. සැපයුම සීමිතව තුබූ අවස්ථාවේදී ඉල්ලුමෙහි බලවේගයන් මගින් පාලනයෙන් ඉවත් කළ මෙකී භාණ්ඩයන් බොහොමයක මිල ඉහළ නැංවීමේ ඝණික බල පෑමක් ඇති කෙරිණි.

අත්‍යාවශ්‍ය භාණ්ඩයන් බෙදා හැරීම සාධාරණව පවත්වා ගන්නා අතර, ඒ සඳහා මිල පාලනයත්, භාණ්ඩ සංඛ්‍යාව සලාක ක්‍රමය යටතේ බෙදාහැරීමත් 1972 දී තවදුරටත් පැවැත්විණි. එසේවුවද ආනයන වියදම් වැඩිවීම හෝ නිෂ්පාදන වියදම් වැඩිවීම හෝ මේ දෙකම හෝ සැළකිල්ලට ගැනීමෙන් පාලනය කළ භාණ්ඩ කිහිපයක මිල වැඩි කරන ලදී.

(අ) කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය

1971 දී සියයට 2·7 කින් වැඩිවූ සියළුම භාණ්ඩයන්ගේ මිල දර්ශකය 1972 දී සියයට 6·3 කින් ඉහළ නැඟුණි. උප දර්ශක, ආහාර සම්බන්ධයෙන් සියයට 6·0 කින්ද, රෙදිපිළි සම්බන්ධයෙන් සියයට 12·8 කින්ද, ඉන්ධන සහ ආලෝකය සියයට 3 6 කින්ද, විවිධ භාණ්ඩ සියයට 6·2 කින්ද වැඩිවිය. 1971 දී මෙම භාණ්ඩයන්ගේ අනුරූප වැඩිවීම් පිළිවෙලින් සියයට 1·8 ක්ද, සියයට 5 6 ක්ද, සියයට 3·5 ක්ද, සියයට 4·1 ක්ද විය. ඉකුත් වර්ෂ වලදී මෙන්ම ගෙවල්කුලී සඳහා වන උප දර්ශකය නොවෙනස්ව පැවතුණි.

---

1. සිල්ලර මිල ගණන් වල වෙනස්වීම් මිනීම සඳහා මෙම දර්ශකය උපයෝගී කරගැනීමෙහිලා ඇතිවන ප්‍රධාන අඩුපාඩුකම් ඉකුත් වාර්ෂික වාර්තාවන්හි සාකච්ඡා කර ඇත.
මෙම අඩුපාඩුකම් ප්‍රධාන වශයෙන්:

   (1) කොළඹ නගරයේ සාමාන්‍ය කම්කරු පංතියේ පවුලක ජීවන වියදමෙහි වෙනස්වීම් මිනීම සඳහා මෙම දර්ශකය සකසා ඇති හෙයින්, මිල ප්‍රමාණයන්හි සාමාන්‍ය මට්ටමෙහි ඇතිවන වෙනස්කම් මිනීම සඳහා එය ප්‍රමාණවත් නොවේ.

   (2) හුදෙක් කම්කරු පංතියේම පාරිභෝජන රටාවෙහි සැළකිය යුතු වෙනස්කම් ඇතිවී තිබියදීත්, 1952 ට පසුව ප්‍රතිශෝධනය කර නොවැඩි යල්පැනගිය බර තැබීම්, සහ

   (3) හිඟකම් හේතුකොට ගෙන ඇතිවූ භාණ්ඩ සැපයුමෙහි උච්චාවචනයන් නිසා, විවෘත සහ පාලනය කළ වෙළෙඳ පොළවල පවත්නා මිල ප්‍රමාණයන්හි සාපේක්ෂිත වැදගත්කම් කෙරෙහි ප්‍රමාණවත් පරිදි සැළකිල්ල යොමු නොකිරීම්.

සමසථ දර්ශකයෙහි සියයට 61·9 ක බර තැබීමක් ඇති ආහාර සඳහා වන උප දර්ශකය වසරේ මුල් කාර්තුවට පසුව සෘජුව ඉහළ නැගිණි ජනවාරියේදී සියයට 145·5 ක්ව පැවැති උප දර්ශකය පෙබරවාරියේදී සහ මාර්තුවේදී පහත වැටුනේ, ප්‍රධාන වශයෙන්ම, එළවළු, පොල් සහ පොල්තෙල් වල මිල පහත වැටීම හේතුකොට ගෙනය. ඉන්පසුව, මෙම උප දර්ශකය ඉහළ නැගෙන උපනතියක් දක්වා ලීය. ආහාර ශීර්ෂයන්ගේ මිල ඉහළ යෑමට තුඩුදුන් ප්‍රධාන සාධක යන් වනුයේ, ව්‍යවහාර මුදල් අනුපාතිකයන් නැවත ගැලපීම හේතුකොට ගෙන ආනයන වියදම් ඉහළ යෑමත්, මිල පාලනයන් ඉවත් කිරීම සහ වියලි මිරිස් හා රතුළූනු වැනි භාණ්ඩයන්ගේ ආනයනය තහනම් කිරීමත්, මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය නිෂ්පාදකයනට හිඟයන් පියවා ගැනීමට නුපුළුවන් වීමත් ය. විදේශ විනිමය හිමිකම් සහතික වල මිල වැඩිවීම සහ ව්‍යාපාර පිරිවැටුම් බදු ක්ෂේත්‍රය පුළුල් කිරීම නිසා, මිල කෙරෙහි මුල් කාර්තුවේදී යම් බලපෑමක් ඇතිවිය. වසර තුළ කෑපී පෙනෙන ලෙස මිල ඉහළ ගිය ශීර්ෂයන් වනුයේ දෙහි, විස්කෝතු, බටර්, මෑ වර්ග, වියලි ඉඟුරු, ජෑම්, හරක් මස් සහ කරවල ය.

II (ඒ) 1 සංඛ්‍යා සටහන

කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය

(පාදය 1952 = 100)

වර්ෂය	සියළුම ශීර්ෂ	භාණ්ඩ අනුව					ගණ අනුව		
		ආහාර	රෙදිපිළි	ඉන්ධන හා එළිය	ගෙවල් කුලී	විවිධ	දේශීය ගණය	ආනයන ගණය	අපනයන ගණය
බරතැබුම	100·0	61·9	9·4	4·3	5·7	18·7	60·0	35·0	5·0
1968 සාමාන්‍යය	121·5	121·2	120·1	103·2	102·5	133·6	123·2	117·3	142·4
1969 සාමාන්‍යය	130·5	127 9	130 9	124·9	108·4	147·1	134·2	123·6	148·2
1970 සාමාන්‍යය	138 2	136·6	137 3	136·1	109·8	153·2	142·9	129·3	157·3
1971									
1 වන කාර්තුව	139·1	136·4	140·9	139·3	109·8	155·8	143·9	129·2	166·2
2 වන කාර්තුව	140·4	137·3	144·3	141·3	109·8	158·1	146·9	128·6	160·7
3 වන කාර්තුව	141·5	138·1	146·1	141·3	109·8	160·1	149·1	128·8	152·1
4 වන කාර්තුව	146·5	144·7	148·5	141·3	109·8	164·1	155·9	132·0	152·7
සාමාන්‍යය	141·9	139·1	145·0	140·8	109·8	159·5	148·9	129·7	157·9
ප්‍රතිශත වෙනස 1970 ට වඩා 1971	2·7	1·8	5·6	3 5	0·0	4·1	4·2	0·3	0.4
1972									
1 වන කාර්තුව	148·1	144·8	154·2	142·8	109·8	168·9	157·7	133·9	147·2
2 වන කාර්තුව	150 3	147·0	160·1	146·4	109·8	169·3	160·8	135·3	143·6
3 වන කාර්තුව	152·2	148·8	168·2	146·4	109·8	169·5	164·0	137·2	128·8
4 වන කාර්තුව	153·0	149·4	171·4	148 0	109·8	170·2	164·0	137·8	143·0
සාමාන්‍යය	150·8	147·5	163·4	145·9	109·8	169·4	161·6	136·1	140·6
ප්‍රතිශත වෙනස 1971 ට වඩා 1972	6·3	6·0	12·8	3·6	0·0	6·2	8·5	4·9	−11·0

මූලය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව

තේ, එළවළු, මාලු, බිත්තර, අර්තාපල් සහ කුළුබඩු වල මිල පහත වැටීම් වාර්තා වී තිබේ. එහෙත්, වසරේ මුළු කාර්තු හතර තුළම නොකඩවා ඉහළ නැහෙමින් පැවැති උප දර්ශකය කෙරෙහි මිල පහත වැටීම් මඟින් ඇතිවූයේ සුළු බලපෑමකි.

රෙදිපිළි උප දර්ශකයෙහි සියයට 12·8 ක වැඩිවීම, උප දර්ශකයන් අතර වාර්තාගත වූ අධිකතම වැඩිවීම විය දර්ශකයේ වැඩිවීමට හේතු වශයෙන් දක්වා ඇත්තේ, ප්‍රධාන කොටම දේශීය නිෂ්පාදනයෙහි නිරත සේවකයනට ගෙවූ අධික වේතන හා අමුද්‍රව්‍යයන්ගේ ගොඩබැ මිල වැඩිවීම ය. මෙම දර්ශකය ජනවාරියේදී 152·0 ක්ව පැවතුන අතර, ඔක්තෝබරයේදී 171·4 හි ඉහළම සංඛ්‍යාවට එළඹ ඉන්පසුව නොවෙනස්ව පැවතුනි. රෙදිපිළි සම්බන්ධ සියළුම ශීර්ෂයන්හි මිලෙහි සැළකිය යුතු වැඩිවීමක් දක්විණි. විශේෂයෙන්ම සරොන්, සාරි සහ වේටටි වල අධික වැඩිවීම වාර්තාගත විය.

ඉන්ධන සහ ආලෝක සඳහා වූ උප දර්ශකය වසර තුළ සියයට 3·6 කින් ඉහළ ගියේය. මෙම වැඩිවීම බොහෝදුරට ඉකුත් වසරේ වැඩිවීම හා සමානුරූප වෙයි මෙම වැඩිවීමට හේතුවූයේ, 1972 මාර්තුවේදී භූමිතෙල් මිලත්, අප්‍රේල් හිදී විදුලිය ගාස්තුත්, නොවැම්බරයේදී ගිනිපෙට්ටි මිලත් ඉහළ නංවා ප්‍රතිශෝධනය කිරීම ය.

විවිධ ශීර්ෂ සඳහා වූ උප දර්ශකයෙහි වැඩිවීම සියයට 6·2 ක් විය. මෙම වැඩිවීම 1971 දී සියයට 4·1 ක් විය. ජූලි මාසයේදී ටයර් හා ටියුබ් වල මිල ප්‍රතිශෝධනය කිරීම හේතුකොට ගෙන ප්‍රවාහන වියදම් වැඩිවිය. දුම්කොළ හා අධ්‍යාපනික ද්‍රව්‍ය වල මිල ගණන්වල වැඩිවීම පිළිවෙලින් නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී වාර්තාගත විය වසර තුළ මිල පහත වැටුන එකම ශීර්ෂය වනුයේ බුලත් සහ පුවක් ය.

(ආ) පාරිභෝගික මිළ දර්ශකයෙන් බාහිර මිල ගණන්

පාරිභෝගික මිල දර්ශකයෙන් බාහිර වූ සීමිත ශීර්ෂයන් සංඛ්‍යාවක මිල දත්තයන් ලබා ගෙන ඇත්තේ, කොළඹ නගරයේ සිල්ලර වෙළෙඳුන් වෙතින් කෙළින්ම විමසීමෙන් හා පළකර ඇති වෙළෙඳ මිල ලැයිස්තු වලිනි. මෙම ශීර්ෂයන් සවිස්තරව විශ්ලේෂණය කිරීම සඳහා පුළුල් වශයෙන් පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ යනුවෙන් වර්ග කරනු ලැබේ.

1971 වසර අවසානයේ සිට 1972 වසර අවසානය දක්වා, තෝරාගත් ශීර්ෂයන්හි මිල ගණන් වල ප්‍රතිශත වෙනස්වීම II (ඒ) 2 සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

පාරිභෝගික භාණ්ඩ

කලින් සැළකිල්ලට භාජනය කරනලද පාරිභෝගික භාණ්ඩ සියල්ලගේම මිල වැඩිවී ඇත. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතුවී ඇත්තේ, අමුද්‍රව්‍ය වල මිල හා වැටුප් වැඩිවීම සහ ආනයන යන්හි ලෝක වෙළෙඳපොලේ මිල වැඩිවීම ය. අධික නැව ගාස්තු විදේශ විනිමය සහනික සහ ව්‍යාපාර පිරිවැටුම් බදු, මිල ඉහළ නැංවීම සඳහා හේතු සාධක වී ඇත. ඇතැම් ශීර්ෂයන් විවෘත වෙළෙඳපොලේ හිඟ වීම ද එම ශීර්ෂයන්ගේ මිල අධික වීමට තුඩු දී ඇත.

මෝටර් රථ අමතර කොටස් වල, ඇති කළ හිඟයත්, කමිස, විදුලිපන්දම් බැටරි, දන්තාලේප වැනි ශීර්ෂයන් මිල පාලනයෙන් ඉවත් කිරීමත් මෙකී පාරිභෝගික භාණ්ඩයන්ගේ මිල ඉහළ නැංවීමෙහිලා හේතුවූ අනෙකුත් සාධකයන් ය තම්බාපු සහල් වල මිල වැඩිවීම, ඉකුත් වසරට වඩා අධික වූ අතර, සියයට 11 ත් සියයට 17 ත් අතර වෙනස් වෙමින් පැවතිණි.

අන්තර් භාණ්ඩ

ප්‍රධාන වශයෙන්ම, නිෂ්පාදන වියදම් අධිකවීම නිසා මෙරට නිෂ්පාදිත අන්තර් භාණ්ඩවල මිල ඉහළ ගොස් තිබේ. පැටල් වල මිල වසර තුළ දෙවරක් ප්‍රතිශෝධනය කර ඇත. පෙබරවාරියේදී සුපිරි පැටල් වල මිල ගැලුම රුපියල් 5/ දක්වාත්, සාමාන්‍ය පැටල් වල මිල රුපියල් 4·80 දක්වාත් වැඩිකරන ලදී. නැවතත් දෙසැම්බරයේදී මෙම මිල ගණන් පිළිවෙලින් ගැලුම රුපියල් 5·75 සහ ගැලුම රුපියල් 5·30 දක්වා නැවත ප්‍රතිශෝධනය කරන ලදී අමුතෙල් මිල ඉහළ යෑමත්, නැව ගාස්තු වැඩිවීමත් පැටල් මිලෙහි මෙකී ප්‍රතිශෝධනයන් ඇතිකිරීමට හේතුවූ මූලික කරුණු විය.

II (එ) 2 සංඛ්‍යා සටහන

පාරිභෝගික මිල දර්ශකයෙන් බාහිර මිල*

ද්‍රව්‍යයේ ස්වභාවය	ප්‍රතිශත වෙනස 1972/71
පාරිභෝගික භාණ්ඩ (කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ ඇතුළුව)	
කව්බාපු සහල්	11 – 17
ටින් කළ මාළු	+ 8
ජෑම්, ජල්ලි, සෝස් සහ කෝඩියල්	3 – 23
දන්තාලේප	28 – 43
වැල්කම් පුයර	6 – 25
ඔසිකොෘලන්	5 – 29
කමිස	14 – 50
ඉටිපන්දම්	+ 11
මිශ්‍ර සම භාණ්ඩ	13 – 35
විදුලි පන්දම සහ ට්‍රාන්සිස්ටර් බැටරි	25 – 27
විදුලි පංකා	+ 40
මහන මැසින්	+ 13
විදුලි බුබුළු	9 – 16
විදුලි සවි කිරීම්	9 – 12
මෝටර් රථ අමතර කොටස්	4 – 37
කාර් බැටරි	+ 20
අන්තර් භාණ්ඩ	
කඩදාසි	24 – 36
පැළිරල්	+ 16
තඹ කම්බි	5 – 9
සෝඩා අළු	10 – 20
කෝස්ටික් සෝඩා	+ 12
ආයෝජන භාණ්ඩ	
ගොඩනැගිලි ද්‍රව්‍ය	4 – 28
1. පාදස්ථල සහිත මුහුණ සෝදන බේසමක් (22"X16") මෙරට ..	+ 16
පාදස්ථල රහිත මුහුණ සෝදන බේසමක් (එම) මෙරට ..	+ 2
2. පහත් වැහිකිළි බඳුන්—මෙරට	+ 3
3. මැටි පයිප්ප 2"X4" එංගලන්තයේ සාදන ලද	+ 27
4. විනවට්ටි පයිප්ප 6'X4" මෙරට	+ 5
යන්ත්‍ර	9 – 31
ලංකා ලෝහ පොරෝ	24 – 40
පිඟි	+ 1
සරතේරු	28 – 73
මෝටිස් දෙර අගුළු	+ 1
බෝල යතුරු තහඩු	+ 74
තඹ කම්බි	5 – 10
ඔටෝ ක්බල්	5 – 9
ප්ලැට් ටුවින්	1 – 66

* ඒ ඒ භාණ්ඩයන් ඉදිරියෙන් දක්වා ඇති ප්‍රතිශත වෙනස්වීම් අන්තරයෙන් නියෝජනය කැරෙන ශ්‍රේණියන්ගේ අඩුම හා ඉහළම ප්‍රතිශත වෙනස්වීම් දක්වයි.

ආයෝජන භාණ්ඩ

රාජ්‍ය වෘත්තේ සංස්ථාවේ නිමැවූ භාණ්ඩ බොහොමයක මිල වසර තුළදී වැඩිකර ඇත. එහෙත් සැලකිය යුතු මිල වැඩිවීමක් ඇතිවී නොමැත. උදළු වල පාලන මිල වැඩිවී තිබේ. නිෂ්පාදන වියදම් වැඩිවීමට අමතරව සිමෙන්ති, ඇස්බෙස්ටෝස් තහඩු සහ අනෙකුත් ආයෝජන භාණ්ඩ හිහවීම නිසා මෙම ගණයේ භාණ්ඩ වල මිල උච්චාවචනයනට හේතුවී ඇත.

මිල පාලනය

වසර තුළදී මිල පාලනයට යටත් කළ ඇතැම් ශීර්ෂයන් අතර, ලාම්පු මැන්ටල්, පෝමික් අම්ලය සහ ඖෂධ වර්ග හතක් ද වෙයි.

පහත සඳහන් භාණ්ඩයන්ගේ පාලන මිල ද ප්‍රතිශෝධනය කර ඇත. ඇස්බෙස්ටෝස් තහඩු, සස්ටජන්, ආනයනය කළ රෙදිපිළි, පිරිසිදු කළ සුදු සීනි, ලක්ස්ප්‍රේ, උකුකිරි, අභ්‍යාස පොත් සහ මෑ ඇට වර්ග සම්භරක්.

වසර තුළදී පහත සඳහන් භාණ්ඩ වල පාලන මිල ඉවත් කරන ලදී. රතුළූනු, වියලි මිරිස්, කටුකම්බි, කෘත්‍රිම රෙදිපිළි, කඩදසි, කාඩ්බෝඩ්, බයිසිකල් ටයර් හා ටියුබ්, විදුලි පන්දම් හා ට්‍රාන්සිස්ටර් බැටරි, දන්තාලේප, ගිණිපෙට්ටි සහ ඖෂධ වර්ග දහයක්.

(ඇ) දේශීය වශයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩයන්ගේ තොග මිල

මෙරට නිෂ්පාදිත භාණ්ඩ නියෝජනය කැරෙන ශීර්ෂ කිහිපයක් එක් එක් පුළුල් ගණය යටතේ II (එ) 3 සංඛ්‍යා සටහනින් දක්වයි. මෙම මිල ගණන් වලින් දක්වෙනුයේ, හුදෙක් නිෂ්පාදකයන් හෝ ඔවුන්ගේඵ කම ඒජන්තවරුන් විසින් ඉදිරිපත් කළ මිල ගණන් විනා තොග බෙදහරින්නන් විසින් තොග බෙදහැරීමේ ව්‍යාපාරයෙහි ඒ ඒ අවස්ථාවන්හි අය කළ මිල ගණන් නොවේ.

රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්, කාර්මික, වාණිජ හා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ මෝටර් වාහන ගණයන්හි භාණ්ඩ විශාල සංඛ්‍යාවක තොග මිල ගණන් වල සැලකිය යුතු වැඩිවීමක් දක්නට විය. ඉකුත් වසරේදී රෙදිපිළි හා ඇඳුම් පැළඳුම් ගණයේ ශීර්ෂයන් බොහොමයක තොග මිලෙහි පැවැති ස්ථාවර බව කෘත්‍රිම රෙදිපිළි පාලනයෙන් ඉවත් කිරීම නිසා මේ වසරේදී කඩවී ගියේය.

ගොඩනැගිලි ද්‍රව්‍ය වල කලින් පැවැති අධික මිල වසර තුළදී යම් පමණකින් ස්ථාවරත්වයට පත්විණි. වසර තුළදී පොහොර වල තොග මිල මද වශයෙන් වැඩිවී තිබේ.

තෝරා ගන්නා ලද දේශීය නිෂ්පාදිත භාණ්ඩවල තොග මිල ගණන්

(දෙසැම්බර් මාසයට)

	ඒකක	1971 කම්හල් මිල රු. ශ.	1972 කම්හල් මිල රු. ශ.	1972/71 වෙනසේ සියයට ගණන
1. ආහාර ද්‍රව්‍ය, බීම වර්ග සහ දුම්කොළ				
චොකලට් (කිරි)	දුසිමක්	10.40	12.85	+ 24
චොකලට් (බිස්කට්)	ටින් 1 ක්	2.50	2.50	—
සිසිල් බීම (පෝටෙලෝ)	බෝතල් 1 ක්	0.40	0.40	—
සිසිල් බීම (සෝඩා)	,,	0.20	0.20	—
රස පානය (පැෂොනා)	,,	5.00	5.00	—
රස පානය (බලැක් කරන්ට්)	,,	6.00	6.00	—
අයිලන්ඩ් ප්‍රයිඩ් දුම් කාල . ..	රාත්තලක්	58.80	61.10	+ 4
ත්‍රිරෝස් සිගරට්	දහස	139.55	148.85	+ 7
2. රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්				
රෙදි (එල්.ඩී.එම්.) සුදු	යාරයක්	2.20	2.40	+ 9
රෙදි (එල්.ඩී.එම්.) වර්ණවත්	,,	2.40	2.40	—
පොප්ලින් – සුදු	,,	2.50	2.75	+ 10
වොයිල් – මුද්‍රිත අලංකාර	,,	2.80	2.80	—
කැවී නූල් – 30 ගණන් පට	,,	4.95	5.20	+ 5
පැබ්රික් සාරි (නයිලෝන් සැටින්) 44''/45'' ..	,,	6.70	11.00	+ 64
කමිස රෙදි (ටෙට්‍රොලීන් පොලිස්ටර්) 35''/36'' ..	,,	8.95	15.00	+ 68
පැබ්රික් ඇඳුම් (නයිලෝන් සැටින්) 35''/36'' ..	,,	6.27	10.25	+ 63
සාරි (සී සිල්ක් බවර් නයිලෝන්)	,,	10.00	10.00	—
කමිස රෙදි (සී සිල්ක් සිල්ව ලයින්)	,,	9.55	12.50	+ 31
ඇඳුම් කවටල රෙදි (සී සිල්ක් ට්‍රෙන්ඩ්)	,,	18.40	21.50	+ 17
3. ඖෂධ සහ පවිත්‍රතා භාණ්ඩ				
ඇස්ප්‍රින් පෙති	1000 ක්	6.75	6.75	—
විටමින් බී මිශ්‍ර පෙති	1000 ක්	5.90	5.90	—
ටෙරමයිසින් (කෝෂ)	බෝ1(කෝ16)	11.75	11.88	+ 1
ඔබරොන් කෝෂ (මල්ටි විටමින්)	බෝ1(කෝ30)	6.61	6.61	—
ඩියුරොල්	බෝතල් 1 ක්	4.05	4.05	—
පෙනිසිලින් වී ඩියුමෙක්ස්	බෝ1(පෙ500)	69.33	64.00	- 8
කෝස්ටික් සෝඩා	මෙට්‍රික් ටෝ. 1	1,720.00	2,000.00	+ 16
ක්ලෝරින් දියර	ටැඟු ටෝ. 1 ක්	2,500.00	2,500.00	—
කැල්සියම් ක්ලෝරයිඩ්	,,	700.00	1,500.00	+114
4. ගෘහ භාණ්ඩ සහ ගෙවල් සවිකරන භාණ්ඩ				
කාර්යාල අල්මාරි (වානේ)	1	635.40	760.00	+ 20
ඇඳුම් අල්මාරි (වානේ)	1	795.00	955.00	+ 20
ලිපිගොනු අල්මාරි (වානේ)	1	600.00	720.00	+ 20
5. ලෝහ භාණ්ඩ සහ විද්‍යුත් භාණ්ඩ				
වානේ – මෘදු වානේ රවුම් ½ ''	මෙට්‍රික් ටෝ. 1	1,930.00	1,930.00	—
වානේ – මෘදු වානේ සමකෝණ 1 x 1 x ⅛ '' ..	,,	1,980.00	1,980.00	—
කලු බැඳුම් කම්බි (ගැල්වනයිස් කළ මි.මී. 5.6 ප්‍රමාණයේ)	,,	2,345.00	2,135.00	- 9
කඩු කම්බි (මි. මී. 2.0 ප්‍රමාණයේ)	රාත්තල් 56	57.25	38.50	- 33
ලංකා ලෝහ උදළු තල (7''x10'')	1	7.90	12.00	+ 52
කම්බි ඇණ	හොණ්ඩර 1	155.00	165.50	+ 7

තෝරා ගන්නා ලද දේශීය නිෂ්පාදිත භාණ්ඩවල තොග මිල ගණන්

(දෙසැම්බර් මාසයට)

	ඒකක	1971 කම්හල් මිල රු. ශ.	1972 කම්හල් මිල රු. ශ.	1972/71 වෙනසේ සියයට ගණන
5. ලෝහ භාණ්ඩ සහ විදුලුත් භාණ්ඩ				
පරිවෘත භා වැස්ම සහිත පී. වී. සී. කේබල් 1/044 ..	යාර 100 ක්	35·00	36·00	+ 3
ඔටෝ කේබල් 35/012	යාර 100 ක්	25·50	28·00	+ 10
සාමාන්‍ය විදුලි සේවා ලාම්පු (වෝ. 25) ..	1	1·93	2·07	+ 7
විශේෂ ලාම්පු (වෝ. 15)	1	2·00	2·15	+ 8
තද ආලෝක බල්බ (වෝ. 60)	1	2·15	2·30	+ 7
6. කාර්මික, වාණිජ හා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ මෙවලම් ටයර් හා ටියුබ්				
ලෝරි බයිසිකල් ටයර් (28 x 1½")	1	5·35	7·15	+ 34
ලෝරි ටයර් (බර වැඩ සඳහා 28 x 1½") ..	1	7·15	8·85	+ 24
මූවටු සහිත ලෝරි ටියුබ් (26 x 1½")	1	3·25	3·60	+ 11
මහන මැෂින් 266 එච්/55 (සිංගර්)	1	805·00	805·00	—
මහන මැෂින් 237 එම./1 ඩබ්. (සිංගර්)	1	1150·00	1380·00	+ 20
සෙන්ටරික් නිවෙස් පොම්ප ¾" (75/1 වර්ගය) ..	1	630·00	747·00	+ 19
සෙන්ටරික් කර්මාන්ත පොම්ප 1¼" (140/3 වර්ගය) ..	1	1237 50	1417·50	+ 15
සෙන්ටරික් කෘෂිකර්මාන්ත පොම්ප ¾" (200/ඊක්ජේ) ..	1	1440·00	1665·00	+ 16
7. කෘෂිකාර්මික අමු ද්‍රව්‍ය				
විශේෂ එළවළු පොහොර (නෝ. 1)	ටොන් 1 ක්	470·00	505·00	+ 7
විශේෂ වී පොහොර (60%)	,,	545·00	620·00	+ 14
මියුරියෙට් ඔප් පොටෑෂ්	,,	610·00	665·00	+ 9
යූරියා	,,	745·00	805·00	+ 8
බිලඩ් මීල්	,,	955·00	960·00	+ 1
සල්ෆේට් ඔෆ් ඇමෝනියා	,,	525·00	550·00	+ 5
සුපෝස් පොස්ෆේට්	,,	395·00	420·00	+ 6
8. දව සහ ගොඩනැගිලි ද්‍රව්‍ය				
පිලි තහඩු	වර්ග අඩියක්	0·88	1·09	+ 24
පැතලි තහඩු	,,	0·55	0·66	+ 20
සිමෙන්ති (කන්කසන්තුරේ)	හෝ. 1 ක්	10·50	10·50	—
සිමෙන්ති (රුහුණු)	,,	12·00	12·00	—
සිමෙන්ති (පුත්තලම)	,,	11·25	11·25	—
9. විවිධ				
විදුලි පන්දම බැටරි	1	0·58	0·71	+ 22
ට්‍රාන්සිස්ටර් බැටරි	1	0·60	0·75	+ 25
ගුවන් විදුලි බැටරි	1	31·50	31·50	—
ලියන කඩදාසි ක්‍රීම්ලේඩ් රිම් පැකට් ..	500 ක් (ඒ 4 වර්ගය)	9·40	9·40	—
යතුරු ලියන කාබන් 8½" x 13"	පෙට්ටි 1 ක්	13·25	13·75	—

2. වැටුප්

රාජ්‍ය අංශයේ කාර්මික හා ලිපිකාර සේවකයන්, සුළු සේවකයන් සහ පාසැල් ගුරුවරුන් සඳහා වැටුප් අනුපාතික දර්ශකයන් මහ බැංකුව විසින් සකස් කරනු ලැබේ. නියෝජිත පරිමාණයන්හි සේවකයනට ගෙවිය යුතු අවම වැටුප් වේතන හා දීමනා මත ඒවා පදනම් වී ඇත. එසේ වුවද, මෙම ගණන් බැලීමට අතිකාල හා වැටුප් වර්ධක ඇතුළත් කර නොමැත. පෞද්ගලික අංශයේ පධිපාලක සභා පාලනයට නතුවන, කෘෂිකාර්මික, කාර්මික හා වාණිජ කටයුතු වල නිරත සේවකයන් සඳහා වැටුප් අනුපාතික දර්ශකයන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. පධිපාලක සභා විසින් නියම කැරුන අවම වැටුප් අනුපාතික මත මෙකී දර්ශකයන් පදනම් වී ඇති අතර 1967 දෙසැම්බරයේ සිට අවප්‍රමාණ දීමනාවද ඊට ඇතුළත් වෙයි. මෙම දර්ශකයන් සඳහා පාද කාලවේදය 1952 වසර වෙයි.

අතිකාල දීමනා පෞද්ගලික අංශයෙහිලා ගෙවන පාරිතෝෂිකයන් වැනි දිරිගැන්වීම් හෝ විශේෂ දීමනා ඇතුළත් වන නියම ඉපැයීම් ඉහත සඳහන් කරනලද මෙකී දර්ශක වලින් නියෝජනය වන්නේ නැත මූර්ත වැටුප් අනුපාතික දර්ශක මහ බැංකුව විසින් ගණන් බලනු ලබන්නේ ජීවන වියදම් දර්ශකයෙන් (කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය) වැටුප් අනුපාතික දර්ශක අවධමනය කිරීමෙනි.

II (ඒ) 4 සංඛ්‍යා සටහනින්, 1971 සහ 1972 සඳහා රජයේ සේවකයන්ගේ වාර්ෂික හා ත්‍රෛමාසික වැටුප් අනුපාතික හා මූර්ත වැටුප් අනුපාතික දර්ශක දැක්වෙයි.

II (එ) 4 සංඛ්‍යා සටහන

රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතික දර්ශකාංක
(1952 = 100)

	කාර්මික හා ලිපිකාර සේවකයෝ		සුළු සේවකයෝ		රජයේ සේවකයෝ (අ)		රජයේ පාසැල් ගුරුවරු	
	වැටුප් අනුපාතික දර්ශකය	මූර්ත වැටුප් අනුපාතික දර්ශකය	වැටුප් අනුපාතික දර්ශකය	මූර්ත වැටුප් අනුපාතික දර්ශකය	වැටුප් අනුපාතික දර්ශකය	මූර්ත වැටුප් අනුපාතික දර්ශකය	වැටුප් අනුපාතික දර්ශකය	මූර්ත වැටුප් අනුපාතික දර්ශකය
1971								
පළමු කාර්තුව ..	157·2	113·0	182·9	131·5	171·3	123·2	141·1	101·5
දෙවන කාර්තුව ..	157·2	112·0	182·9	130·3	171·3	122·0	141·1	100·5
තුන්වන කාර්තුව ..	157·2	111·1	182·9	129·3	171·3	121·1	141·1	99·7
සතරවන කාර්තුව ..	157·2	107·3	182·9	124·8	171·3	116·9	141·1	96·3
සාමාන්‍යය ..	**157·2**	**110·9**	**182·9**	**129·0**	**171·3**	**120·8**	**141·1**	**99·5**
1972								
පළමු කාර්තුව ..	157·2	106·2	182·9	123·5	171·3	115·7	141·1	95·3
දෙවන කාර්තුව ..	157·2	104·6	182·9	121·7	171·3	114·0	141·1	93·9
තුන්වන කාර්තුව ..	157·2	103·3	182·9	120·2	171·3	112·6	141·1	92·7
සතරවන කාර්තුව ..	158·2	103·4	185·2	121·0	173·0	113·1	141·5	93·5
සාමාන්‍යය ..	**157·4**	**104·4**	**183·4**	**121·6**	**171·7**	**113·8**	**141·2**	**93·6**
1971 ට වඩා 1972 ප්‍රතිශත වෙනස	+0·1	−5·9	+0·3	−5·7	+0·2	−5·8	+0·1	−5·9

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ලිපිකාර හා කාර්මික සහ සුළු සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

සංලක්ෂ්‍යය: 1959 සැප්තැම්බර් 30 වැනිදට සේවයෙහි යෙදී සිටි සේවක සංඛ්‍යාවන් මත පදනම්වූ නිශ්චිත බර කැබීම මත මෙම දර්ශකාංකයන් ගණනය කර ඇත. දර්ශකාංකයන් ගණනය කිරීමේදී යොදගෙන ඇති වැටුප් අනුපාතිකයන් වනුයේ, එක් එක් නියෝජන පරිමාවෙහි වූ මූලික වැටුප් සහ දීමනාවන්ය.

කාර්මික හා ලිපිකාර සේවකයන්ගේ, සුළු සේවකයන්ගේ සහ පාසැල් ගුරුවරුන්ගේ වැටුප් අනුපාතික 1971 තුළද 1972 නොවැම්බර් දක්වාද නොවෙනස්ව පැවතුණි. එසේ වුවද, අයවැය යෝජනාවනට අනුකූලව, රුපියල් 250/- කට අඩු වැටුපක් ලබන, මාසිකව වැටුප් ලබන සේවකයනට විශේෂ දීමනාවක් ගෙවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතිකයන්හි වැඩිවීමක් ඇති විය.

මෙම දර්ශකයට ඇතුළත් වන සියළුම රජයේ සේවකයන් සම්බන්ධ 1972 අවසාන කාර්තුව සඳහා වැටුප් අනුපාතික දර්ශක, වසරේ ඉකුත් කාර්තු තුනේ කිනම් කාර්තුවකටත් වඩා අධික බැව් පෙන්වයි. අනෙක් අතට, සියළුම ගණ වල සේවකයන්ගේ වාර්ෂික සාමාන්‍ය වැටුප් අනුපාතික දර්ශක 1971 සාමාන්‍යයට වඩා මදකින් වැඩි වී ඇත.

රජයේ පාසැල් ගුරුවරුන් සහ ලිපිකාර සේවකයන් සම්බන්ධ දර්ශක සියයට 0·1 කින් වැඩිවූ අතර සුළු සේවකයන් සම්බන්ධයෙන් සියයට 0·3 ක වැඩිවීමක් ඇති වී තිබේ. කාර්මික හා ලිපිකාර සේවකයන්ගේ, සුළු සේවකයන්ගේ සහ පාසැල් ගුරුවරුන්ගේ ත්‍රෛමාසික මූර්ත වැටුප් දර්ශක 1971 ඒ ඒ කාර්තු වලට වඩා 1972 දී අඩු වී ඇත.

සියළුම ගණ වල සේවකයන්ගේ වාර්ෂික සාමාන්‍ය වැටුප් දර්ශක 1971 දීට වඩා 1972 දී පහත වැටී ඇත. රජයේ පාසැල් ගුරුවරුන් හා ලිපිකාර සේවකයන් සම්බන්ධ දර්ශකයන්හි පහත වැටීම සියයට 5·9 ක්වී ඇති අතර සුළු සේවකයන් සම්බන්ධයෙන් සියයට 5·7 ක අඩුවීමක් ඇති වී තිබේ.

පෞද්ගලික අංශයේ, ඇතැම් පඩිපාලක සහ පාලනයට නතුවන සේවකයන් සම්බන්ධව 1971 හා 1972 සඳහා වාර්ෂික හා ත්‍රෛමාසික අවම වැටුප් අනුපාතික දර්ශක පහත සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

II (එ) 5 සංඛ්‍යා සටහන

පඩි පාලක සහ කර්මාන්තයන්හි සේවකයන් සඳහා අවම වැටුප් අනුපාතික දර්ශකාංක. (1952 = 100)

		කෘෂිකර්මාන්තයෙහි නියුතු සේවකයෝ (අ)		වාණිජ හා කර්මාන්ත කටයුතුවල නියුතු සේවකයෝ (ආ)		පඩි පාලක සභාවලට නතුවන කර්මාන්තයන්හි සේවකයෝ (ඇ)	
		අවම වැටුප් අනුපාතික දර්ශකය	මූර්ත වැටුප් අනුපාතික දර්ශකය	අවම වැටුප් අනුපාතික දර්ශකය	මූර්ත වැටුප් අනුපාතික දර්ශකය	අවම වැටුප් අනුපාතික දර්ශකය	මූර්ත වැටුප් අනුපාතික දර්ශකය
1971	පළමු කාර්තුව ..	140·7	101·1	175·2	126·0	144·3	103·8
	දෙවන කාර්තුව ..	140·8	100·3	175·6	125·1	144·6	103·0
	තෙවන කාර්තුව ..	141·3	99·9	175·7	124·2	145·1	102·1
	සතරවන කාර්තුව ..	143·5	98·0	178·1	121·5	147·2	100·5
	සාමාන්‍යය ..	141·9	99·8	176·1	124·2	145·3	102·0
1972	පළමු කාර්තුව ..	145·6	98·3	180·5	121·9	149·2	100·8
	දෙවන කාර්තුව ..	146·3	97·3	181·1	120·5	149·8	99·7
	තෙවන කාර්තුව ..	148·5	97·6	181·9	119·5	152·0	99·9
	සතරවන කාර්තුව ..	153·6	100·3	182·5	119·3	156·5	102·3
	සාමාන්‍යය ..	148·5	98·4	181·4	120·3	156·9	100·7
	1971 ට වඩා 1972 ප්‍රතිශත වෙනස	+4·7	−1·4	+3 0 =	−3·1	+8·0	−1·3

මූලය: කම්කරු, පාර්ලිමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තේ වගාව හා නිෂ්පාදනය, රබර් වගාව හා නිෂ්පාදනය සහ පොල් වගා කර්මාන්ත පමණක් අඩංගු වේ.

(ආ) පොල් නිෂ්පාදනය, ඉංජිනේරු, මුද්‍රණ කටයුතු, ගිනිපෙට්ටි නිෂ්පාදනය, මෝටර් රථ ප්‍රවාහනය, නැව් තටාක, වරාය, වරාය ප්‍රවාහණ, තේ අපනයන, රබර් අපනයන සිනමා සහ ගොඩනැගිලි කර්මාන්තයන් පමණක් අඩංගු වේ.

(ඇ) කෘෂිකාර්මික සේවකයන් සහ වාණිජ හා කාර්මික සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

1972 දී, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වාර්ෂික හා ත්‍රෛමාසික වැටුප් අනුපාතික දර්ශක ඉකුත් වර්ෂයේ දර්ශක වලට වඩා වැඩි වී ඇත. කෘෂිකාර්මික කටයුතු වල නිරත සේවකයන් සඳහා වූ වාර්ෂික සාමාන්‍ය දර්ශකය 1971 වාර්ෂික සාමාන්‍යය ඉක්මවා සියයට 4·7 ක වැඩිවීමක් වාර්තා කර ඇත. 1972 සඳහා සාමාන්‍යය 148·5 කි. කර්මාන්ත හා වාණිජ කටයුතු වල නිරත සේවකයන් සඳහා සාමාන්‍ය වැටුප් අනුපාතික දර්ශකය 1971 දී 176·1 ක්ව පැවැති අතර, සියයට 3·0 ක වැඩිවීමක් වාර්තා කරමින් 1972 දී 181·4 දක්වා ඉහළ ගොස් තිබේ.

කෘෂිකාර්මික, කාර්මික හා වාණිජ කටයුතු වල නිරත සේවකයන් සහ පඩිපාලක සහා යටතට ගැනෙන සේවකයන් සඳහා වූ දර්ශක, විශේෂයෙන්ම 1972, 3 වැනි කාර්තුවේදී ඉහළ නැගීමට හේතු වී ඇත්තේද, 1968[1] අංක 40 දරන සේවක අවප්‍රමාණ අතුරු දීමනා පනතේ 4 (1) වගන්තියට අනුකූලව උසස් දීමනාවන් ගෙවීම හේතුකොටගෙනය.

කෘෂිකාර්මික, කාර්මික හා වාණිජ කටයුතු වල නිරත සේවකයන් සහ පඩිපාලක සහා යටතට ගැනෙන වෘත්තීන්හි නියුතු සේවකයන් සඳහා වූ වාර්ෂික සාමාන්‍ය මූර්ත වැටුප් අනුපාතික දර්ශකය 1972 දී පිළිවෙලින් සියයට 1.4 කින්, 3·1 කින් හා 1·3 කින් පහත වැටිණි.

1971 ජූලි මාසයේදී අත්සන් තබන ලද. රබර් අපනයන, මෝටර් ප්‍රවාහන, ඉංජිනේරු, මුද්‍රණ, තේ අපනයන, කොහුමෙට්ට හා පීරු කෙඳි කර්මාන්තයන්හි කය වෙහෙසා වැඩ කරන සේවකයන් සම්බන්ධ සාමූහික ගිවිසුම් නියමයන් කාර්මික ආරවුල් පනතේ විධිවිධානය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් 1972·2·1 දින නිකුත් කරන ලද ආඥාවක් මගින් සේවකයන් 25 කට නොවැඩි සංඛ්‍යාවක් සේවයෙහි යොදවන මෙකී කර්මාන්තයන්හි යෙදී සිටින සියළුම සේවා යෝජකයන්ට අදාළ කරවිය.

මෙම සාමූහික ගිවිසුම් වල ප්‍රධාන ලක්ෂණයන් වනුයේ, වැටුප් වර්ධක පරිමානයන් මත ඒකාබද්ධ මාසික වැටුප් සඳහාත්, සේවක අර්ථසාධක අරමුදල ආරම්භ කිරීමට පෙරාතුව වූ කාලපරිච්ඡේදය සඳහා පාරිතෝෂික ගෙවීමටත්, ප්‍රසාද මුදල් බෙරුම් කිරීම, ආරාවුල්, ආරාවුල් හා විනයානුකූල ක්‍රියාමාර්ග පිළිබඳව වෘත්තීය සමිති වලට කරුණු පිරික්සීමටත් විධිවිධාන සැලැස්වීමය.

ගඩොල් හා උළු නිෂ්පාදන කර්මාන්තයෙහි නියුතු සේවකයනට අදළ අවම වැටුප් අනුපාතික දිනකට රුපියල් 1·35 ක වැඩිවීමක් සමග ඒකාබද්ධ කරනු ලැබූ අතර සුරුට්ටු නිෂ්පාදන කර්මාන්තයට අදළ කැලි ප්‍රමාණ ක්‍රමයේ අවම වැටුප්ද 1972·4·1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 2·00 කින් වැඩි කර ඇත.

මේස් ආදී භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ නියුතු සේවකයනට ගෙවිය යුතු අවම ඒකාබද්ධ වැටුප් 1972·7·1 වැනි දින සිට ශත 50 කින් වැඩි කැරුන අතර දුම්කොළ කර්මාන්තයෙහි නියුතු සේවකයන් සඳහා වැටුප් වැඩි කිරීම පහත දැක්වෙන පදනම් අනුව සිදු කරන ලදී.

එක් දිනකට සේවකයෙකුට	—	ශත 90 යි.
,, සේවිකාවකට	—	ශත 70 යි.
,, ලමා සේවකයෙකුට	—	ශත 50 යි.

මෙයට අතිරේක වශයෙන්, දුම්කොළ කර්මාන්තය සඳහා වූ පඩිපාලක සභාව විසින් සේවකයනට සියළු පඩිනඩි සහිතව ප්‍රසිද්ධ නිවාඩු දින 9 ක් ලබා දී ඇත.

---

1. මෙම පනත යටතේ, සේවකයනට, අවප්‍රමාණ දීමනාවක්ද, 1967 දෙසැම්බර් වටිනාකමට ඇවුරුණු ජීවන වියදම් දීමනාවක් හෝ විශේෂ දීමනාවක්ද ගෙවනු ලැබේ. යම් විටෙක, ජීවන වියදම් දර්ශකය අනුව ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව හෝ විශේෂ දීමනාව මෙම පනත යටතේ ගෙවිය යුතු දීමනාවන්ගේ එකතුව ඉක්මවනු ලැබුවහොත් එම අතිරික්තය ලැබීමට සේවකයනට හිමිකමක් ඇති බවටද, මෙම පනතේ විධිවිධාන සලසා තිබේ.

1972 ඔක්තෝබර් 27 වැනි දින දරන ගැසට් නිවේදනය ප්‍රකාරව, ගිනිපෙට්ටි නිෂ්පාදන කර්මාන්තයෙහි නියුතු නවක සේවකයනට හා මුරකරුවනට අදළ අවම වැටුප් 1972 නොවැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකාබද්ධ කොට වැඩි කරන ලදී. පොල් වගා කර්මාන්තය සඳහා වූ පඩිපාලක සභාව විසින් පඩිනඩි සහිත ප්‍රසිද්ධ නිවාඩු දින ගණන 1972 නොවැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි දින දෙකේ සිට දින හතර දක්වා වැඩි කරන ලදී.

1972 අංක 1 දරන හදිසි රෙගුලාසියේ 4 වැනි වගන්තිය (වැවිලි කර්මාන්තයෙහි සේවකයන්ගේ අතිරේක විශේෂ දීමනාව) ප්‍රකාරව වත්මන් වැටුප් වලට අතිරේක වශයෙන්, වැවිලි කර්මාන්තයෙහි සේවකයනට ගෙවිය යුතු විශේෂ අතුරු දීමනාව 1972 නොවැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක විය. සේවකයනට ගෙවනු ලබන්නේ පහත සඳහන් පදනම අනුවය.

එක් දිනකට සේවකයෙකුට	—	ශත 18 යි.
එක් දිනකට සේවිකාවකට	—	ශත 12 යි.

සිනමා කර්මාන්තය සඳහා වූ පඩිපාලක සභාව විසින් සිනමා කළමනාකරුවනට හා සහකාර කළමනාකරුවනට 1972 නොවැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අළුත් වැටුප් ක්‍රමයක් සකස් කර තිබේ. නාගරික පෙදෙස් වල කළමනාකරුවනට හා සහකාර කළමනාකරුවනට පිළිවෙලින් මසකට රුපියල් 450/- ක් හා රුපියල් 285/- ක් බැගින් ගෙවන අතර නාගරිකයෙන් පිට පෙදෙස් වල පිළිවෙලින් මසකට රුපියල් 300/- ක් හා රුපියල් 225/- ක් බැගින් ගෙවනු ලැබේ.

දැනට මසකට රුපියල් 180/- කට අඩු වැටුපක් ලබන (සියලු දීමනා සහිතව) රජයේ සේවාවේ, රාජ්‍ය සංස්ථා වල සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල මාසිකව වැටුප් ලබන සියළුම සේවකයනට 1972 දෙසැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඔවුන්ගේ මාසික වේතනය හෝ වැටුප මසකට රුපියල් 180/- කර ගැනීම සඳහා, මසකට රුපියල් 7·50 ක අවම දීමනාවකට යටත්ව විශේෂ දීමනාවක් ලැබෙන බව මුදල් ඇමතිවරයා විසින් සිය අයවැය කථාවේදී ප්‍රකාශයට පත් කරන ලදී. එසේම, මසකට රුපියල් 180/- සිට මසකට රුපියල් 250/- දක්වා (සියළු දීමනා ඇතුළුව) වේතන/වැටුප් කොටයාශයේ මාසික වැටුප් ලබන සියලුම සේවකයනට රුපියල් 7·50 ක විශේෂ දීමනාවක් ලැබෙන අතර, සියළු දීමනා සහිතව මසකට රුපියල් 250/ ත් මසකට රුපියල් 257/- ත් අතර ආන්තික ගැලපීම් සිදු කෙරෙනු ඇත. මෙම වැඩපිළිවෙල නිසා මාසික වැටුප් ලබන සේවකයන් 3,20,000 කට පමණ වාසියක් සැලසෙනු ඇතැයි ගණන් බලා තිබේ.